**විෂය : භූගෝල විද්‍යාව පුණරීක්ෂණය**

**සතිය 25**

**ශ්‍රේණිය : 6**

**සකස් කිරීම _ මාවනැල්ල කලාපය**

## 1 - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 වී වගාවට හානිකරන කෘමීන් විනාශ කිරීම සඳහා .................................................. මිනිසාට උදව් කරයි. (ඇටිකුකුළා / බත්කුරා / කපුටා)

02 පාසල් වත්තේ හැඩය හඳුනාගැනීමට ..................................... ප්‍රයෝජනවත් වේ. (ගේට්ටුව / බැම්ම / මායිම)

03 පාසලක අනන්‍යතාවය ප්‍රකාශ කිරීමේදී අධ්‍යාපන කලාපයට පසුව ........................................................... යොදනු ලැබේ. (දිස්ත්‍රික්කය / අධ්‍යාපන කොට්ඨාසය / අධ්‍යාපන කාර්යාලය)

04 ගෘහ ආශ්‍රිතව සිදුකරනු ලබන කර්මාන්ත ........................................................................ ගණයට අයත්ය. (මහා පරිමාණ කර්මාන්ත / කුඩා පරිමාණ කර්මාන්ත / මධ්‍ය පරිමාණ කර්මාන්ත)

05 උතුරු මැද පළාතට අනුරාධපුරය හා ..................................................................... දිස්ත්‍රික්කය අයත් වේ. (මාතලේ / වව්නියාව / පොළොන්නරුව)

**අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට දැක්වෙන ප්‍රකාශය නිවැරදි නම් ✓ ද වැරදි නම් ✗ ලකුණද යොදන්න.**

06 චිත්‍රයට වඩා සිතියමකින් භූගෝලීය ලක්ෂණවල පිහිටීම, දුර ප්‍රමාණය හා හැඩය නිශ්චිතව දක්විය හැක. ( )

07 වවුලා ඵල හටගැනීමට අවශ්‍ය පරාගනය සිදුකරන සතෙකි. ( )

08 ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය පළාත වේ. ( )

09 බස්නාහිර දිශාව හා උතුරු දිශාව අතර වයඹ දිශාව පිහිටා ඇත. ( )

10 ශ්‍රී ලංකාවේ කඳුකර කලාපයේ වගා කරන ප්‍රධාන භෝගයක් ලෙස බීට්රූට් වගාව දක්විය හැකිය. ( )